# පළාත් සභා නිවේදන

අංකය : ව/පස/2/1/19 (17)

## වයඹ පළාත් සභාව

වයඹ පළාතේ පළාත් සභාවේ 2000 අංක 1 දරන වයඹ පළාතේ ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 2000.01.18 වැනි දින සම්මත කරන ලදුව, 2000.02.01 වැනි දින වයඹ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළු දෙනාගේ දැනගැනීම සඳහා මෙහි පහත පළවේ.

එස්. හිරිමුතුගොඩ,
ලේකම්,
වයඹ පළාත් සභාව.

2000 පෙබරවාරි මස 10 වැනි දින,
කුරුණෑගල වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයේ දී ය.

වයඹ පළාතේ පළාත් සභාවේ 2000 අංක 1 දරන වයඹ පළාතේ ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය
(වයඹ ආණ්ඩුකාරවරයා අනුමැතිය දුන් දිනය - 2000.02.01)

වයඹ පළාතේ ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරියක් පිහිටුවීම සඳහා ද ඒ අධිකාරියේ, බලතල කාර්ය සහ කර්තව්‍ය නියමය කොට දැක්වීම පිණිස ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික හෝ කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තිය මංමාවත් ආඥාපනතට ද, 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනතට ද අනුකූල වූවකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2000 අංක 1 දරන වයඹ පළාතේ ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය

### *I වන කොටස*

### *වයඹ පළාතේ ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය පිහිටුවීම සහ එහි සංයුතිය*

වයඹ පළාතේ ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය පිහිටුවීම

2. (1) මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන වයඹ පළාතේ ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය යනුවෙන් හැඳින්වෙන අධිකාරියක් මෙයින් පිහිටුවනු ලැබේ.

(2) අධිකාරිය (1) වන උප වගන්තියෙන් එයට පවරා ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතුය. තව ද, ඒ නාමයෙන් එය විසින් නඩු පැවරිය හැකි අතර, එයට විරුද්ධව ද ඒ නාමයෙන් නඩු පවරනු ලැබිය හැකිය.

(3) අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව, ශාඛා කාර්යාල අවශ්‍ය විය හැකි සංඛ්‍යාවක් පිහිටුවා පවත්වාගෙන යා හැකිය.

අධිකාරියේ සාමාජිකයෝ

3. (1) අධිකාරිය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය :

(අ) සිවිල් ඉංජිනේරු විද්‍යාව, මහාමාර්ග ඉංජිනේරු විද්‍යාව, වාණිජ්‍යය, මූල්‍ය හෝ පරිපාලනය පිළිබඳ පුළුල් පළපුරුද්දක් හා නිපුණත්වයක් දක්වා ඇතැයි ප්‍රධාන අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතුරෙන් ප්‍රධාන අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු (මෙහි මින් මතු "පත්කළ සාමාජිකයින්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් තුන් දෙනෙක් සහ

(ආ) පහත දැක්වෙන ආකාරයට නම් කරන ලද සාමාජිකයන් දෙදෙනෙක්,

(i) "පළාත් පාලනය" විෂයභාර පළාත් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්,

(ii) මාර්ග විෂයභාර පළාත් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්.

(2) පත්කළ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු ප්‍රධාන අමාත්‍යවරයා විසින් අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කළ යුතුය.

(3) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයකු අධිකාරියේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබීමට හෝ එසේ කටයුතු කරගෙන යාමට හෝ සුදුස්සෙකු නොවන්නේ ය.

(4) යම් තැනැත්තෙකු අධිකාරියේ සාමාජිකයකු ලෙස පත් කිරීමට පෙර, අධිකාරියේ සාමාජිකයකු වශයෙන් ඒ තැනැත්තා විසින් ඔහුගේ කර්තව්‍ය ඉටුකිරීමේ දී එම කටයුතුවලට හානිකර ලෙස බලපෑමට ඉඩ ඇති කිසිදු මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඒ තැනැත්තාට නොමැති බවට, ප්‍රධාන අමාත්‍යවරයා සෑහීමට පත්විය යුතුය. තව ද, අධිකාරියේ කිසිම සාමාජිකයකුට එවැනි සම්බන්ධතාවක් නොමැති බවට ප්‍රධාන අමාත්‍යවරයා කලින් කල සෑහීමට පත්විය යුතුය. මෙම උප වගන්තිය යටතේ සිය කාර්යය තමා විසින් ඉටුකරනු ලැබීමූ සඳහා අවශ්‍ය යැයි ප්‍රධාන අමාත්‍යවරයා විසින් සලකන තොරතුරු තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටිනු ලබන කවර හෝ විටක, ඒ තොරතුරු අධිකාරියේ සාමාජිකයකු ලෙස ප්‍රධාන අමාත්‍යවරයා විසින් පත්කරන තැනැත්තකු විසින් හෝ ඒ අධිකාරියේ සාමාජිකයකු ලෙස පත් කිරීමට ප්‍රධාන අමාත්‍යවරයා අදහස් කර සිටින යම් තැනැත්තකු විසින් හෝ ප්‍රධාන අමාත්‍යවරයා වෙත සපයනු ලැබිය යුතුය.

(5) අධිකාරිය විසින් ඇතිකරගන්නා ලද හෝ ඇතිකර ගැනීමට යෝජිත හෝ ගිවිසුමක් පිළිබඳව, කෙළින්ම හෝ අන් අයුරකින් කිසියම් සම්බන්ධතාවයක් ඇති අධිකාරියේ සාමාජිකයකු විසින්, ඔහුගේ සම්බන්ධතාවේ ස්වභාවය අධිකාරියේ රැස්වීමක දී හෙළිදරව් කරනු ලැබිය යුතු අතර, ඒ හෙළිදරව් කිරීම අධිකාරියේ රැස්වීම් වාර්තාවල වාර්තාගත කරනු ලැබිය යුතුය. තව ද, අධිකාරිය විසින් ඒ ගිවිසුම් සළකා බැලීමේ දී හෝ ඒ පිළිබඳව තීරණයකට එළඹීමේ දී ඒ සාමාජිකයා එම කටයුතුවලට සහභාගි නොවිය යුතුය.

(6) අධිකාරියේ පත්කළ සෑම සාමාජිකයකුම, ඔහු පත්කරනු ලැබූ දිනයේ සිට ගැනෙන හා ඔහු පත්කරනු ලබන අවස්ථාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අවුරුදු තුනක් නොඉක්මවන කාලයක්, (8) වන හා (9) වන උප වගන්තිවල විධිවිධානවලට යටත්ව, ධුරය දැරිය යුතු අතර, (8) වන උප වගන්තිය යටතේ ධුරයෙන් ඉවත්කරන ලද්දේ නම් මිස, නැවත පත්කරනු ලැබීමට සුදුස්සෙකු විය යුතුය. තව ද, පත්කළ සාමාජිකයෙකුගේ පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කරනු ලබන වෙනත් පත්කළ සාමාජිකයකු කලින් සිය තනතුර පුරප්පාඩු කළහොත් මිස, ඔහුට කලින් එම තනතුර දැරූ සාමාජිකයාගේ ධුර කාලයේ ඉතිරිව ඇති කාලය වෙනුවෙන් පමණක් ධුරය දැරිය යුතුය.

(7) (9) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධුරකාලය, අධිකාරියේ ඔහුගේ සාමාජිකත්ව කාල සීමාව වන්නේය.

(8) කවර හෝ පත්කළ සාමාජිකයකු, ප්‍රධාන අමාත්‍යවරයා විසින්, *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයක් මගින් හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(9) අධිකාරියේ සාමාජිකයකු සම්බන්ධයෙන්, ප්‍රධාන අමාත්‍යවරයා විසින් (8) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇති විටක ඒ නියමය *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ දිනයේ දී ඒ සාමාජිකයාගේ ධුරය හිස් විය යුතුය.

(10) ඉල්ලා අස්වන බවට ප්‍රධාන අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන් අධිකාරියේ පත්කළ සාමජිකයෙකුට සාමාජිකයකු වශයෙන් වූ හෝ සභාපති වශයෙන් වූ හෝ ස්වකීය ධුරයෙන් ඕනෑම අවස්ථාවක දී ඉල්ලා අස්විය හැකිය.

(11) රෝගාතුර වීම නිසා හෝ වෙනත් අබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ අධිකාරියේ යම් සාමාජිකයකු ස්වකීය ධුරයේ කාර්ය ඉටුකිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක–

(අ) ඔහු පත්කළ සාමාජිකයකු නම්, (1) (අ) උපවගන්තියේ විධිවිධාන සැළකිල්ලට ගෙන ප්‍රධාන, අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු, ඒ සාමාජිකයා වෙනුවට වැඩ බැලීම සඳහා පත් කළ හැකිය. *නැතහොත්,*

(ආ) ඔහු නම්කළ සාමාජිකයකු වන්නේ නම්, එම සාමාජිකයා නම්කළ බලධාරියා විසින් වෙනත් පුද්ගලයෙකු එම සාමාජිකයා වෙනුවට නම්කළ හැකිය.

(12) අධිකාරියේ සභාපතිවරයා රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ තම ධුරයේ කටයුතු කිරීමට තාවකාලිකව අපොහොසත් වන්නේ නම් සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීමට ප්‍රධාන අමාත්‍යවරයා විසින් වෙනත් පත්කළ සාමාජිකයකු පත් කළ හැකිය.

(13) අධිකාරියේ ඕනෑම සාමාජිකයකුගේ සාමාජිකත්වය මරණය, ඉවත් කිරීම, ඉල්ලා අස්වීම හෝ කාලය ඉකුත් වීම හෝ නිසා අවසන් වන්නේය.

4 අධිකාරියේ සියලුම සාමාජිකයන්ට හෝ සාමාජිකයන්ගෙන් කිසිවකුට අමාත්‍ය මණ්ඩලයේ මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ප්‍රධාන අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික දීමනා සහ වෙනත් වියදම්, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය. සාමාජිකයන්ගේ පාරිශ්‍රමික හා දීමනා

අධිකාරියේ රැස්වීම්

5\. (1) අධිකාරියේ සභාපතිවරයා පැමිණ සිටින, අධිකාරියේ සෑම රැස්වීමකම මූලාසනය, ඔහු විසින් දැරිය යුතුය. අධිකාරියේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කරගනු ලබන යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතුය.

(2) අවම තරමින් මසකට එක්වරකටවත් යටත්ව අධිකාරිය විසින් අවශ්‍ය යැයි සලකනු ලබන කවර හෝ අවස්ථාවක එය රැස්විය යුතුය.

(3) අධිකාරියේ යම් රැස්වීමක මූලාසනය දරන තැනැත්තාට තමාගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතුය.

(4) අධිකාරියේ යම් රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් තුන්දෙනෙකු විය යුතුය.

(5) අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබිය දී වුව ද අධිකාරියට ක්‍රියාකළ හැකිය. අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයකු පත් කිරීමෙහි හෝ නම් කිරීමෙහි ලා හෝ යම් දෝෂයක් තිබීම පමණක් හේතුකොටගෙන අධිකාරියේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් හෝ නිර්බල නොවන අතර නිර්බල සේ සලකනු නොලැබිය යුතුය.

(6) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව, අධිකාරියේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙනයාම පිළිබඳ කාර්ය පටිපාටිය සඳහා ඒ අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකිය. අධිකාරිය විසින් එසේ සාදනු ලබන රීති ප්‍රධාන අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබනතුරු බලාත්මක නොවිය යුතුය.

අධිකාරියේ මුද්‍රාව

6\. (1) අධිකාරියේ මුද්‍රාව අධිකාරියේ සභාපතිවරයා භාරයේ තිබිය යුතුය.

(2) අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයට අධිකාරියේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකිය.

(3) එක් අයෙකු අධිකාරියේ සභාපතිවරයා වන්නා වූ අධිකාරියේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට අධිකාරියේ මුද්‍රාව තබනු නොලැබිය යුතුය. ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණසිටි බවට සංකේතයක් වශයෙන් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතුය.

## *II වන කොටස*

### *මාර්ග සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සහ පළාත්බද අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය*

අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය

7\. (1) මාර්ග සම්බන්ධයෙන්,

(අ) අමාත්‍යවරයා විසින් කලින්කල අධිකාරිය වෙත දෙනු ලැබිය හැකි යම් විධානයන්ට යටත්ව ඒ ප්‍රදේශ ඇතුළත අනුකලනය කළ මාර්ග සැලසුම් කිරීම හා මාර්ග සංවර්ධනය කරගෙන යාම ;

(ආ) ප්‍රධාන අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරිය වෙත දෙනු ලැබිය හැකි යම් විධානයන්ට යටත්ව, ඒ ප්‍රදේශවල අනුකලනය කළ මාර්ග සැලසුම් කිරීම හා අනුකූල වූ ඒ ප්‍රදේශවල මාර්ග සංවර්ධන වැඩ, ක්‍රියාකාරකම් හා සේවාවන් හා සම්බන්ධිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඇ) පළාත් මාර්ග සම්බන්ධයෙන් මූලධන ආයෝජන සැලසුම් ඇතුලුව මාර්ග සංවර්ධන සැලසුම් සම්පාදනය කිරීම හා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම ;

(ඈ) යම් ලිඛිත නීතියක සඳහන් කොන්දේසිවලට යටත්ව මාර්ගවල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට ශ්‍රී ලංකාව තුළ නැතහොත් ඉන් පිටත යම් තැනැත්තකු සමග අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව කෙළින්ම හෝ හවුල් ව්‍යාපාරයක ස්වරූපයෙන් හෝ ඇතුළත්වීම, ඒවා ඉටුකරවා ගැනීම හා කරගෙන යාම ;

(ඉ) යම් මාර්ගයක යම් අනුමත මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් හෝ යෝජනා ක්‍රමයක් නිම කිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු විසින් පැහැරහරින ඒ ව්‍යාපෘතිය හෝ යෝජනා ක්‍රමය නිම කිරීමට භාරගැනීම ;

(ඊ) යම් මාර්ගයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ මාර්ග සංවර්ධන සැලසුම් හා මූලධන ආයෝජන සැලසුම් ක්‍රියාත්මක කිරීම ;

(උ) යම් මාර්ගයක මාර්ග සංවර්ධන වැඩිදියුණු කිරීමේ වැඩසටහන් සම්පාදනය කිරීම ;

(ඌ) යම් මාර්ගයක සංවර්ධන කටයුතු සඳහා යම් චංචල හෝ නිශ්චල හෝ දේපළක් මිළදී ගැනීම හෝ 21 වන වගන්තියට යටත්ව යම් චංචල හෝ නිශ්චල හෝ දේපළක් අත්කරගැනීම, නැතහොත් එය විසින් අත්කරගනු ලැබූ හෝ දැරූ යම් චංචල හෝ නිශ්චල දේපළක් බැහැර කිරීම ;

(එ) ආණ්ඩුවේ යම් නියෝජිතායතනයක ඉල්ලීම අනුව, ඒ නියෝජිතායතනය වෙනුවෙන් මාර්ග සංවර්ධන ව්‍යාපෘති හා යෝජනා ක්‍රම පිළියෙල කිරීම හා ඒ ව්‍යාපෘති හා යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය කිරීම හෝ ඊට සහාය වීම ;

(ඒ) ආණ්ඩුවේ නියෝජිතායතනවල හෝ වෙනත් තැනැත්තන්ගේ හෝ ප්‍රයෝජනය සඳහා මාර්ග සැලසුම් සේවා සැපයීම ;

(ඔ) අධිකාරිය විසින් මාර්ග සම්බන්ධයෙන් සපයනු ලබන කවර වූ හෝ සේවාවන් සඳහා ගාස්තු අය කිරීම ;

(ඕ) මාර්ග සම්බන්ධයෙන් ඉටු කරන කටයුතු සඳහා මුදලින් හෝ අන්‍යාකාරයෙන් හෝ ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග හෝ ආධාර භාරගැනීම සහ අධිකාරියේ අරමුණු අතුරෙන් කවර හෝ අරමුණක් ඉටුකර ගැනීම සඳහා ඒවා උපයෝගී කර ගැනීම ;

(ක) මෙම ප්‍රඥප්තිය යටතේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හා කිරීම සම්බන්ධයෙන් ප්‍රාසංගික හෝ ආනුෂංගික වන්නා වූ සියලු ක්‍රියා හෝ දේවල් හෝ කිරීම ;

අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය වේ.

(2) (1) වන උපවගන්තිය යටතේ ස්වකීය බලතල කාර්ය හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමෙහි, ඉටුකිරීම හා ඉටුකිරීමෙහි හා ඉටුකිරීමෙහි ලා යම් මාර්ගයක් සම්බන්ධයෙන් මාර්ග සැලසුම් කිරීම හෝ මාර්ග සංවර්ධනය හා සම්බන්ධ යම් සංවර්ධන වැඩසටහනක් සකස් කරනවිට හෝ ක්‍රියාත්මක කරන විට, යෝජිත වැඩකටයුතු අයිතිවාසිකම් සම්බන්ධතා හෝ කර්තව්‍යයන් කෙරෙහි බලපෑමක් ඇතිවේ ද අවස්ථාවෝචිත පරිදි, ඒ පළාත් අමාත්‍යාංශයක දෙපාර්තමේන්තුවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් නැතහොත් රාජ්‍ය දෙපාර්තමේන්තුවක් හෝ සංස්ථාවක හෝ පළාත් පාලන ආයතනයක් හෝ විමසා ඒවා සකස් කිරීම හෝ ක්‍රියාත්මක කිරීම අධිකාරියේ කාර්යයන් වන්නේය.

(3) අධිකාරිය විසින් මෙම ප්‍රඥප්තිය යටතේ එයට පැවරුණු බලතල යම් පළාත් පාලන ආයතනයක් විසින් යම් නීතියක් යටතේ නඩත්තු කරනු ලබන හෝ පරිපාලනය කරනු ලබන යම් මාර්ගයක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැක්කේ එකී පළාත් පාලන ආයතනයේ ප්‍රකාශිත අනුමැතිය හෝ ඉල්ලීමක් ඇත්නම් පමණි.

(4) (1) වන උපවගන්තිය යටතේ ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි, ඉටුකිරීමෙහි හා ඉටුකිරීමෙහි ලා යම් මාර්ගයන් සම්බන්ධයෙන් මාර්ග සැලසුම් කිරීම හෝ මාර්ග සංවර්ධනය හා සම්බන්ධ යම් සංවර්ධන වැඩසටහනක් සකස් කරන විට හෝ ක්‍රියාත්මක කරන විට යම් පළාත් පාලන ආයතනයකට අයත් ප්‍රදේශයක් ඒ සංවර්ධන ප්‍රදේශයට ඇතුළත් වන්නේ නම් හෝ අභිව්‍යාප්ත වන්නේ නම්, අධිකාරියේ ඒ සංවර්ධන වැඩසටහන හා සම්බන්ධ රැස්වීමට හෝ රැස්වීම්වලට පැමිණ සහභාගි වන ලෙස, ඒ පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයාට නැතහොත් සභාපතිවරයාට ආරාධනා කිරීම, අධිකාරියේ වගකීම වන්නේය.

8. (1) අධිකාරිය විසින් එහි බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියට සාමාන්‍ය හෝ විශේෂ විධාන දිය හැකි අතර, අධිකාරිය විසින් ඒ විධාන බලාත්මක කළ යුතුය. අමාත්‍යවරයාගේ විධාන

(2) අධිකාරියේ දේපළ සහ කටයුතු පිළිබඳ වාර වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු තමා නියම කරන ආකෘතියකින් තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් අධිකාරියට කලින් කල ලියවිල්ලකින් විධාන කළ හැකි අතර, අධිකාරිය විසින් ඒ සෑම විධානයක්ම ක්‍රියාත්මක කළ යුතුය.

9. (1) මේ ප්‍රඥප්තිය යටතේ වූ ස්වකීය බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් අධිකාරිය විසින් අධිකාරියේ සභාපතිවරයාට හෝ යම් නිලධාරියකුට ලියවිල්ලකින් පැවරිය හැකිය. අධිකාරිය විසින් බලතල ආදිය පැවරීම

(2) ඉහත (1) උපවගන්තිය අනුව අධිකාරියේ බලතල කාර්ය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් පවරනු ලැබූවිට, එසේ පැවරීමේ දී අධිකාරිය විසින් දෙන ලද කිසියම් විධාන වේ නම් එයට යටත්ව එම බලතල කාර්ය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හෝ කිරීම අදාළ පරිදි සභාපතිවරයාගේ හෝ එම නිලධාරියාගේ කාර්ය වන්නේය.

## *III වන කොටස*

### *අධිකාරියේ කාර්ය මණ්ඩලය*

10. (1) අධිකාරිය විසින් ප්‍රධාන අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ අනුමැතිය ඇතිව, අධිකාරිය සඳහා සාමාන්‍යාධිකාරිවරයකු පත්කරනු ලැබිය යුතුය. අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා

(2) ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව අධිකාරියේ පොදු මෙහෙයවීමට යටත්ව අධිකාරියේ වැඩකටයුතු මෙහෙයවීම ද, අධිකාරියේ බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම ඉටුකිරීම හා කිරීම ද, අධිකාරියේ සේවා නියුක්තයන් පිළිබඳ පරිපාලනය හා විනය පාලනය ද සාමාන්‍යාධිකාරිවරයාට භාර වේ.

(3) තමාගේ බලතල කර්තව්‍ය හෝ කාර්ය අතුරින් අධිකාරියේ වෙනත් යම් සේවකයෙකුට පැවරීම අවශ්‍යයැයි සාමාන්‍යාධිකාරීවරයා කලින් කල සලකනු ලබන බලතල කර්තව්‍ය හෝ කාර්ය අධිකාරියේ ලියවිල්ලකින් වූ අනුමැතිය අනුව, සාමාන්‍යාධිකාරීවරයා විසින් ලියවිල්ලකින්, ඒ සේවා නියුක්තයාට පැවරිය හැකි අතර, එවැනි යම් බලතල කර්තව්‍ය හෝ කාර්යය එසේ පවරනු ලැබූ යම් සේවානියුක්තයකු විසින් සාමාන්‍යාධිකාරීවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට යටත්ව ඒවා ක්‍රියාත්මක කළ යුතුය.

(4) අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව සාමාන්‍යාධිකාරීවරයා ධුරයෙන් ඉවත් කරනු නොලැබිය යුතුය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයේ පත්වීම් ආදිය

11\. (1) මෙම ප්‍රඥප්තිය යටතේ සාමාන්‍යාධිකාරීවරයාට පැවරෙන බලතල, කර්තව්‍ය හෝ කාර්යය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම සඳහා ඔහුට සහාය වීම පිණිස අවශ්‍ය වේ යැයි සැලකෙන සේවකයන් සංඛ්‍යාවක් අධිකාරිය මගින් පත්කරනු ලැබිය හැකිය.

(2) ඉහත (1) උපවගන්තිය යටතේ පත් කරනු ලබන සියලුම සේවා නියුක්තයන් සාමාන්‍යාධිකාරීවරයා විසින් වරින්වර පවරනු ලබන හෝ භාර කරනු ලබන බලතල කර්තව්‍ය හෝ කාර්යයන් ක්‍රියාත්මක, ඉටුකිරීම හා කිරීම කරනු ලැබිය යුතුය.

(3) මෙම අධිකාරියේ ඉල්ලීම පිට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නියුක්ත අයගේ කැමත්ත හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හෝ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය හෝ මුදාහැරීම මත පළාත් අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා තාවකාලිකව හෝ මෙම අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලයට හෝ පත්කරනු ලැබිය හැකිය.

## *IV වන කොටස*

## *මුදල්*

අධිකාරියේ පළාත් මාර්ග ගිණුම

12\. (1) මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා මෙහි මින්මතු ප්‍රාදේශීය මාර්ග ගිණුම යනුවෙන් හඳුන්වනු ලබන, පළාත් සභා අරමුදලින් නඩත්තු වන වෙනම මාර්ග ගිණුමක් අධිකාරිය සඳහා තිබිය යුතුය.

(2) සාමාන්‍යාධිකාරීවරයා විසින් ප්‍රාදේශීය මාර්ග ගිණුම ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

(3) ප්‍රාදේශීය මාර්ග ගිණුමේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් දස ලක්ෂයක් විය යුතුය. එම මුදල් ප්‍රමාණය අමාත්‍ය මණ්ඩලයේ මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන වාරික මුදල්වලින් පළාත් සභා අරමුදලින් ප්‍රාදේශීය මාර්ග ගිණුමට බැර කරනු ලැබිය යුතුය.

(4) පළාත් මාර්ග ගිණුම 1987 අංක 42 දරන පළාත් සභා පනතේ III වන කොටසේ විධිවිධානවලට යටත් විය යුතුය.

අධිකාරියේ අරමුදල්

13\. (1) ප්‍රාදේශීය මාර්ග ගිණුමේ ආරම්භක ප්‍රාග්ධනය හැර පහත සඳහන් අරමුදල් පළමුව පළාත් සභා අරමුදලට ගෙවා ඉන්පසුව ප්‍රාදේශීය මාර්ග ගිණුමට බැර කරනු ලැබිය යුතුය ;

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පළාත් සභාව විසින් වරින්වර සම්මත කරනු ලැබිය හැකි සියලුම මුදල් ප්‍රමාණයන් ;

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ ස්වකීය බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කිරීමේ දී හා කිරීමේ දී අධිකාරියට ලැබෙන සියලුම මුදල් ප්‍රමාණයන් ; හා

(ඇ) අධිකාරියේ බැරට උපචිත වන සියලු මුදල්.

පළාත් මාර්ග ගිණුමෙන් කරන ගෙවීම්

14\. මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරියේ බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කිරීමේ දී හා කිරීමේදී දැරීමට සිදුවන වියදම් ද, අධිකාරියේ සාමාජිකයින්ට පාරිශ්‍රමික ගෙවීම සඳහා ද සාමාන්‍යාධිකාරීවරයා හා අනෙකුත් සියලු සේවා නියුක්තයන්ට වැටුප් හා දීමනා ගෙවීම සඳහා ද මෙම ප්‍රඥප්තිය යටතේ දැරීමට සිදුවන අනෙකුත් සියලු වියදම් සඳහා ද වන සියලු ගෙවීම් කිරීම පිණිස සාමාන්‍යාධිකාරීවරයා විසින් සභාපතිවරයාගේ එකඟත්වය ඇතිව ප්‍රාදේශීය මාර්ග ගිණුම ප්‍රයෝජනයට ගනු ලැබිය හැකිය.

අධිකාරියේ ණය ගැනීමේ බලතල

15\. මේ ප්‍රඥප්තිය යටතේ අධිකාරියේ කාර්යය ඉටු කිරීමේ දී සිය වගකීම් ඉටුකිරීම සඳහා අධිකාරියට අවශ්‍ය වනු ලබන මුදල්, අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව හෝ ඔහු විසින් දෙන ලද පොදු අවසරයක නියමයන්ට අනුකූලව, අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ අධිකාරිය විසින් තාවකාලිකව ණයට ගත හැකිය.

එසේ වුව ද, අධිකාරිය විසින් මේ වගන්තිය යටතේ ලබා ගන්නා ලද යම් තාවකාලික ණය මුදල් වෙනුවෙන් ගෙවීමට ඉතිරි වී ඇති මුළු මුදල කිසිම අවස්ථාවක දී අමාත්‍ය මණ්ඩලයේ මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතුය.

16. අධිකාරියේ මුදල් වර්ෂය දින් වර්ෂය විය යුතුය. අධිකාරියේ මුදල් වර්ෂය

17. (1) එක් එක් මුදල් වර්ෂය සඳහා වන අධිකාරියේ ගිණුම් එම මුදල් වර්ෂය අවසන් වී මාස හයක් ඉකුත් වීමට පෙර විගණනය සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. මෙම ගිණුම් විගණන සඳහා ඔහුට සහාය වීම පිණිස ඔහුගේ පාලනය හා විධානය යටතේ කටයුතු කරන සුදුසුකම් ලත් ගණන් පරීක්ෂකවරයකු හෝ ගණන් පරීක්ෂකවරුන් විගණකාධිපතිවරයා විසින් සේවයේ යොදවනු ලැබිය හැකිය. අධිකාරියේ විගණන කටයුතු

(2) අධිකාරියේ ගිණුම් විගණනය සඳහා ඔහු විසින් දරන ලද වියදම් වෙනුවෙන් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි යම් පාරිශ්‍රමිකයන් අධිකාරියේ අරමුදලින් විගණකාධිපතිවරයාට ගෙවනු ලැබිය හැකිය.

(3) විගණන කටයුතු සඳහා විගණකාධිපති විසින් අවශ්‍ය යැයි සැලකෙන සියලුම පොත් පත්, ඔප්පු, කොන්ත්‍රාත්, ගිණුම්, වවුචර් හා ලියවිලි එම ගිණුම් විගණනය කරන විගණකාධිපතිවරයාට සහ ඔහුට සහයවන වෙනත් ඕනෑම පුද්ගලයකුට අධිකාරිය විසින් ලබාදිය යුතුය. එසේම ඒ සඳහා අවශ්‍ය විය හැකි තමන් දන්නා සියළුම තොරතුරු අධිකාරියේ නිලධාරීන් විසින් සපයා දිය යුතුය.

(4) මෙම කොටසේ පරමාර්ථ සඳහා සුදුසුකම් ලත් ගණන් පරීක්ෂක යනුවෙන් –

(අ) ගණකාධිකාරීවරයකු ලෙස කටයුතු කිරීම සඳහා එම ආයතනයේ කවුන්සලය මගින් නිකුත් කරන ලද සහතිකයක් දරන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයක් හෝ නීතිය මගින් පිහිටවන ලද වෙනත් ආයතනයක සාමාජිකයෙක් වන පුද්ගලයෙක් ; හෝ

(ආ) එක් එක් මාසික හවුල්කරුවාට, ගණකාධිකාරීවරයකු ලෙස කටයුතු කිරීම සඳහා එම ආයතනයේ කවුන්සලය මගින් නිකුත් කරන ලද සහතිකයක් සමග ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් ආයතනයක සාමාජිකත්වය දරන හවුල්කරුවන්ගෙන් සමන්විත ගණකාධිකාරී සමාගමක් අදහස් වේ.

18. (1) විගණකාධිපතිවරයා අධිකාරියේ ගිණුම් පරීක්ෂා කොට-

(අ) ඔහුට අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් ලැබුණු හෝ නොලැබුන බව අදහස් කරමින්, අධිකාරියේ විගණන වාර්තාව

(ආ) අධිකාරියේ කටයුතු සත්‍ය හා සාධාරණ ලෙස පෙන්නුම් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ගිණුම් වාර්තා මැනවින් පිළියෙළ කර තිබේ ද යන්න සඳහන් කරමින්,

(ඇ) ඔහුගේ මතය අනුව, පළාත් සභාව විසින් අධිකාරියේ ගිණුම් හා කටයුතු පිළිබඳව කිසියම් පරීක්ෂණයක් කිරීම සඳහා උනන්දුවක් දැක්විය යුතුයැයි අදහස් කරන ගණුම්වලට අදාළ කිසියම් කරුණක් වේ නම්, ඒ ගැන අවධානය යොමු කරමින්,

වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

(2) විගණකාධිපතිවරයා සිය වාර්තාවේ විගණනය කරන ලද ගිණුම් සමග සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

19. එක් එක් වර්ෂයේ විගණනය කරන ලද ගිණුම් හා විගණකාධිපතිවරයාගේ වාර්තාව ලද විට එම වාර්තාව හා ගිණුම ඒ ඒ වර්ෂයේ අධිකාරියේ කටයුතු පිළිබඳ වාර්තාවක් සභාපතිවරයා විසින් අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතුය. අමාත්‍යවරයා විසින් එම වාර්තාවල පිටපත් අධිකාරියේ එම ගිණුම් අදාළ වන වර්ෂය අවසන් වී මාස දොළහක් ඉක්මයාමට පෙර පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය. විගණකාධිපතිවරයාගේ වාර්තාව හා අධිකාරියේ වාර්ෂික කටයුතු පිළිබඳ වාර්තාව අමාත්‍යවරයාට යැවිය යුතු බව

## V වන කොටස

## පොදු විධිවිධාන

20. (1) මෙම ප්‍රඥප්තියේ කිසියම් කටයුත්තක් සඳහා පළාත තුළ පිහිටා ඇති කිසියම් ඉඩමක් අවශ්‍යවේ යැයි අමාත්‍යවරයා අදහස් කරන්නේ නම් එවිට, ඉඩම් උපයෝගී කර ගැනීමේ කළමනාකරණය

(අ) එම ඉඩම රජයට අයත් ඉඩමක් වන්නේ නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ I වන ලැයිස්තුවේ 11 වන පරිශිෂ්ටයේ 1.3 වන ඡේදය පරිදි එම ඉඩම අදාළ කටයුතු සඳහා පළාත් සභාවට ලබාදෙන ලෙස ජන රජයේ ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටීමට ; හා

(ආ) එම ඉඩම පෞද්ගලික ඉඩමක් වන්නේ නම්, අදාළ කටයුතු සඳහා එය පළාත් සභාව වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ විධිවිධාන පරිදි අත්පත් කරගෙන ලබා දෙන ලෙස අමාත්‍ය මණ්ඩලයේ ඉඩම් විෂය භාර අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටීමට ප්‍රධාන අමාත්‍යවරයාට හැකිය.

(2) ඉහත (1) උපවගන්තියේ විධිවිධාන පරිදි වන ඉල්ලීමක් මත අවශ්‍යතාවෝචිත පරිදි ජනරජයේ ජනාධිපතිවරයා හෝ අමාත්‍ය මණ්ඩලයේ ඉඩම් විෂය භාර අමාත්‍යවරයා හෝ විසින් අදාළ ඉඩම් පළාත් සභාවට ලබා දෙනු ලැබුවහොත් පළාත් සභාව විසින් එම ඉඩම ලබාදෙන අවස්ථාවේ දී අවශ්‍යතාවෝචිත පරිදි ජනරජයේ ජනාධිපතිවරයා විසින් හෝ අමාත්‍ය මණ්ඩලයේ ඉඩම් විෂය භාර අමාත්‍යවරයා හෝ විසින් වෙන්දි ගෙවීම ද ඇතුළුව නියම කරනු ලබන යම්කිසි රීති හා කොන්දේසි වලට යටත්ව, ඉල්ලා සිටින ලද කාරණය සඳහා පමණක් එම ඉඩම ප්‍රයෝජනයට ගතයුතු අතර, වෙනත් කිසිම කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළුවීම සඳහා බලය

21. අධිකාරියේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් සාමාන්‍යයෙන් හෝ විශේෂ වශයෙන් බලය දෙනු ලැබූ යම් නිලධාරියෙකු විසින් පළාත තුළ පිහිටි යම් ඉඩමක් හෝ ස්ථානයක අයිතිකරුවෙකු හෝ පදිංචි කරුවෙකු වෙත ලියවිල්ලකින් යටත් පිරිසෙයින් දින හතක දැනුම් දීමක් කිරීමෙන් පසුව ඒ ඉඩම හෝ ස්ථානයට ඇතුල්වීම සහ එහි දී ප්‍රඥප්තිය යටතේ මාර්ග සංවර්ධනයට සම්බන්ධ හෝ අධිකාරියේ බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හා කිරීමට අවශ්‍යතාවෝචිත පරිදි සභාපතිවරයා හෝ අදාළ නිලධාරියාගේ මතය අනුව යුක්ති සහගතව අවශ්‍ය වියහැකි යම් ක්‍රියාවක් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

රෙගුලාසි

22. (1) මෙම ප්‍රඥප්තිය හා එහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ බලාත්මක කිරීම සඳහා හෝ මෙම ප්‍රඥප්තිය යටතේ විග්‍රහ කළයුතු සියලු කාරණා සඳහා ද අමාත්‍යවරයා විසින් රෙගුලාසි සම්පාදනය කළහැක.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම රෙගුලාසියක්ම ගැසට් පත්‍රයේ පළ කළයුතු අතර, එය ගැසට් පත්‍රයේ පළ කළ දින සිට හෝ එහි නිශ්චය වශයෙන් සඳහන් කර ඇති පසුව එළඹෙන දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් පනවන ලද රෙගුලාසි ගැසට් පත්‍රයේ පළවීමෙන් පසු හැකිතාක් ඉක්මනින් ඒවා අනුමැතිය සඳහා පළාත් සභාව ඉදිරියේ තැබිය යුතුය. එමෙන්ම ඒ අයුරින් අනුමත කරනු නොලැබූ නියෝග වෙතොත් එය අනුමත කරනු නොලැබූ දින සිට අවලංගු කළායේ සැළකිය යුතු වුවත්, එම රෙගුලාසි යටතේ ගනු ලැබූ කවර හෝ ක්‍රියාමාර්ගයක් කෙරෙහි එම අවලංගුවීම බල නොපෑ යුතු අතර, අමාත්‍යවරයා විසින් පනවන ලද යම් රෙගුලාසියක් මේ අයුරින් අවලංගුවූවා සේ සැලකිය යුත්තේ කවර දිනක සිට ද යන්න දැන්වීමක් මගින් ගැසට් පත්‍රයේ පළකළ යුතුය.

දණ්ඩන

23 මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් රෙගුලාසියක් හෝ කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ සෑම තැනැත්තෙක්ම මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරුවෙන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ ලඝු නඩු විභාගයක දී වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් එක්දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

අර්ථ නිරූපනය

24. මෙම ප්‍රඥප්තියේ :-

"අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා අදහස් වේ.

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ.

"ආණ්ඩුවේ නියෝජිතායතනය" යන්නෙන් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය සංස්ථාවක් අදහස් වේ.

"පළාත" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාත අදහස් වේ.

"පළාත් අරමුදල" යන්නෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 වන වගන්තියේ සඳහන් වන පළාත් අරමුදල අදහස් වේ.

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි සභාවක් විසින් ක්‍රියාත්මක කරන, ඉටු කරන බලතලවලට කාර්යයන් සහ කර්තව්‍යයන්ට අනුරූප වන හෝ සමාන බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම ඉටුකිරීම, හා කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ යටතේ ඇති කරනු ලැබූ හෝ, පිහිටවනු ලැබූ යම් අධිකාරියක් එයට ඇතුළත් වේ.

"පළාත් සභාව" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව ද අදහස් වේ.

"ප්‍රධාන අමාත්‍යවරයා" යන්නෙන් අදහස් කරන්නේ වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා වේ.

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් සමාගම් අඥාපනත යටතේ හැර වෙනත් කිසියම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටවනු ලබන්නාවූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලින් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නාවූ ද,සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ.

"මාර්ගය" යන්නෙන් මංමාවත් ආඥාපනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය. එසේවුවද වුවත් රජයට අයත් මහා මාර්ග ඊට ඇතුළත් නොවන්නේ ය.

"මාර්ග සංවර්ධනය" යන්නට අලුතින් මාර්ගයක් ඉදිකිරීම, පවත්නා කිසියම් මාර්ගයක් නඩත්තු කිරීම හෝ වැඩි දියුණු කිරීම, කිසියම් මාර්ගයක් පළල් කිරීම, කිසියම් මාර්ගයක් මට්ටම් කිරීම, පදිකයන්ගේ ප්‍රයෝජනය පිණිස පදික වේදිකා සැපයීම, දූවිලි වලින් ඇති වන හිරිහැරය අඩු කිරීම සඳහා මහා මාර්ගයකට ප්‍රතිකර්ම යෙදීම, ගස් රෝපණය හා තණකොළ තීරු ඇති කිරීම හා පළාත තුළ පිහිටි මාර්ගයක සිදුකරන පාලම් බෝක්කු ඉදිකිරීම ස්වාභාවික ජල බැසීමේ ක්‍රම ඇති කිරීම ද වෙනත් අත්දමේ ඉදිකිරීම් හා අලුත්වැඩියාවන් ද ඇතුළත් වේ.

25. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. කිසියම් අනනුකූලතාවයක දී සිංහල භාෂා පාඨය වලංගු බව

03-837